# විශිෂ්ඨ ශිල්පීන්ට ජාත්‍යන්තර වේදිකාවක් හදන්න කිසිම රජයකට බැරිවුණා

## ප්‍රවීණ තාල වාද්‍ය ශිල්පී දර්ශනපති විජේරත්න රණතුංග

කලාවෙහි නියැළෙන්නන් අතුරින් බොහෝ විට විදෙස් සංචාරයන් සඳහා ඇරයුම් ලැබෙන්නේ ගායක ගායිකාවනටය. ඔවුන් තරමටම ප්‍රසංග හා සංචාරයන් සඳහා වාද්‍ය ශිල්පීන්ට අවස්ථාව නොලැබෙන්නේ ඒ එක් වාදක කණ්ඩායමක් සමග ගායක ගායිකාවෝ කිහිප පළක්ම සම්බන්ධ වන බැවිනි.

මෙයිනුත් තාල තරංග වාද්‍ය ශිල්පීන්ට ලැබෙන අවස්ථාව ඉතාම අල්පය. ඒ සංගීත කණ්ඩායමක අඩුම සහභාගීත්වය ඇත්තේ ද තාල තරංග වාද්‍ය ශිල්පීන්ට බැවිනි. එහෙත් මෙරට වාද්‍ය ශිල්පීන් අතරින් වැඩිම ප්‍රසංග ගණනාවක් හා වැඩිම සංචාර ගණනාවකට සහභාගි වූ වාද්‍ය ශිල්පියෙක් වෙයි. ඒ තාල තරංග වාද්‍ය ශිල්පී දර්ශනපති විජේරත්න රණතුංගය. ගුවන් විදුලියේ විශිෂ්ඨ ශ්‍රේණියේ වාද්‍ය ශිල්පියකු හා කැලණිය විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකුද වන විජේරත්න රණතුංගයන් සමග වාද්‍ය වෘන්දයක තබ්ලාවේ භාවිතය හා වැඩිම විදෙස් සංචාරයන් ගණනකට සහභාගිවීමට ලැබීමේ රහස් ගැන විමසීමු.

දැනට විදෙස් සංචාර කීයකට විතර සහභාගි වෙලා තියෙනවද?
මුලින්ම මම සංචාරයකට සහභාගි වුණේ 1978 අවුරුද්දේ. ඒ වික්ටර් රත්නායකයන් සමග. එහිදී මැලේසියාව, ෆිනෑන්, සිංගප්පූරුව වැනි රටවල සංචාරය කළා.

ඒ කියන්නේ වික්ටර්ගේ ''ස'' ප්‍රසංගයටද?
නැහැ. නැහැ. මම යෝජනා කළා වික්ටර්ට ලංකාවේ ප්‍රසංග තිබ්බා ඇති පිටරටවලත් ප්‍රසංගයක් කරමු කියලා. මොකද වික්ටර් ඒ කාලයේදී පිටරටවල හිටිය ශ්‍රී ලාංකිකයින් අතරත් බොහොම ප්‍රසිද්ධ වෙලා හිටියා. එය ''ස'' ප්‍රසංගය හැටියට නෙවෙයි පැවැත්තුවේ. වෙනම ප්‍රසංග මාලාවක් හැටියට ''ස'' ප්‍රසංගයට නියමිත ශිල්පීන් හිටියේ නැහැ. වාද්‍ය ශිල්පියෙක් හැටියට මා පමණයි සහභාගි වුණේ.

ඩ එතකොට අනික් ශිල්පීන් කොහෙන්ද හොයා ගත්තේ.
ඒ අය ඒ රටවලින්ම සහභාගි කර ගත්තා. නමුත් තාල තරංග වාදනයෙන් මට සහභාගි වෙන්න වුණා.

ඒ කියන්නේ ඒ කාලෙ ඉඳලම ඔබ විශිෂ්ට හැකියාව පෙන්නුම් කළා.
ඔව්. සමහර විට ඒක වෙන්නත් පුළුවන්.

මෙතෙක් සංචාර කීයකට විතර සහභාගි වෙලා තියෙනවාද?
ගණනින් නම් මෙතෙකැයි කියන්න මතකයක් නැහැ. නමුත් 1978 ඉඳලා මේ දක්වා හැම වසරකම විදෙස් සංචාර තුන හතරකට සහභාගි වෙනවාමයි. අවසන් සංචාරය නිම කළේ මේ නොවැම්බර් 27 වැනිදා මාස දෙකක ඇමෙරිකාවේ සංචාරයකින්.

වෙනත් වාද්‍ය ශිල්පීන්ට නැති මෙවැනි වරප්‍රසාදයක් කොහොමද ඔබට ලැබුණේ.
අපේ රටේ වාද්‍ය ශිල්පීන්ට තියෙන ගැටලුවක් තමයි ඔවුන් එක්කෝ සරල වාද්‍ය ශිල්පීන් නැත්නම් තනිකරම ශස්ත්‍රීය වාද්‍ය ශිල්පීන්. හැබැයි සරල වාදනය බොහොම ජනප්‍රියයි. මේ ජනප්‍රියත්වය නිසාම එයින් බැහැර වෙන්න ඔවුන් අකමැතියි. ඒක සාමාන්‍ය මානුෂික හැඟීමනෙ. නමුත් මා සරල හා ශාස්ත්‍රීය වාදනය එක ලෙස ප්‍රගුණ කළ කෙනෙක්. ඒ නිසා මටත් බොහෝ ආරාධනාවන් ලැබෙනවා. ඒකල වාදනයන් ඉදිරිපත් කරන්න. ඒක ඉතිං සින්දුවකට ගහනව




> කේමදාස කියන්නෙ විශ්ව කර්ම මැවීමක් කියලයි මම හිතන්නේ. ඔහු තබ්ලාවේ මූලික පද ටික මට කියල දුන්නා. ඉන්පසු පෙර ආත්ම භවයෙ මම සංගීතය නවත්තපු තැනින් නැවත මේ ආත්මේදි පටන් ගත්තා

වගේ නෙවීනෙ. මේ තුළ ලබන ආශ්වාදය වැඩියි. ඒ නිසා මටත් ලැබෙන අවස්ථාවන් වැඩියිත ඒකයි ඒ වරප්‍රසාදය ලැබෙන්න හේතුව.

අමරදේවයන් නිතර පවසන්නේ තබ්ලාව ඉන්දියානු වාද්‍ය භාණ්ඩයක් වුවත් සිංහල ගීතයට නැවුම් ශෛල්‍යයක් එක් කළ විශිෂ්ඨ තාල තරංග ශිල්පියා ඔබයි කියලා. කොහොමද ඔබ ශෛලිය ගොඩනගා ගත්තෙ.
ඒක තමයි සරල හා ශාස්ත්‍රීය සංගීතය එක ලෙස ප්‍රගුණ කිරීමෙන් ශිල්පියෙකු තුළ ඇති වන නිර්මාණ කුසලතාවය. මේක මා තුළ පමණක් රඳවා තැබිය යුතු නැහැ. තවත් තාල තරංග වාද්‍ය ශිල්පීන් මේ රටේ ඉන්නවා. මමත් කැමැති එවැනි ශිල්පියකු කළ නිර්මාණාත්මක ශෛල්‍යයක් රස විඳින්න. කවුරුත් කරන්නෙ අනුකරණය අනුකාරකයන්ට නිර්මාණකරුවන් වෙන්න බැහැ. තවත් එක් ශිල්පියකුට හෝ හැකිනම් ස්ව තන්ත්‍ර වාද්‍ය ශිල්පියෙක් වෙන්න, අන්න එදාට මටත් හැකිසි අමරදේවයන් මා ගැන කළ ප්‍රකාශය ඔහුටත් කරන්න.

ගුවන් විදුලියේ විශිෂ්ඨ ශ්‍රේණියේ තාල තරංග වාද්‍ය ශිල්පියෙක් වෙන්නටත් විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙක් දක්වා ආගමනේ දීත් ඔබගේ ගුරුවරුන් වුණේ කවුද?
මට හිටිය එකම ගුරුවරයා තමයි ආචාර්ය ප්‍රේමසිරි කේමදාස.

කේමදාසයන් තබ්ලා වාද්‍ය ශිල්පියෙක් නෙවීනේ ?
කේමදාස කියන්නෙ විශ්ව කර්ම මැවීමක් කියලයි මම හිතන්නේ. ඔහු තබ්ලාවේ මූලික පද ටික මට කියල දුන්නා. ඉන්පසු පෙර ආත්ම භවයෙ මම සංගීතය නවත්තපු තැනින් නැවත මේ ආත්මේදි පටන් ගත්තා. මම හිතන්නේ ආත්ම ගණනක ඉඳලා කරගෙන ආ ජන්ම පුරුද්දක් මේක. සෑම වාදනයක් තුළම තියෙන්නේ මගේ ශෛල්‍ය. මේවා මා විසින්ම නිර්මාණය කළ දේවල්. අනුකරණ කිසිවක් නැහැ.

ඔබගේ ශිෂ්‍යයන්ට ඔබ පුරුදු පුහුණු කරන්නෙත් ඔබේම නිර්මාණ ?
ඔව්. ඒකේ වෙනසක් නැහැ. ඔවුන් තුළ තිබෙන්නෙත් මාගේ නිර්මාණ මා හැමවිටම උපදෙස් දෙන්නෙත් ඒ තුළින් තව තව අලුත් නිර්මාණ බිහි කරන්න කියලයි.

ඔවුන් එයට උනන්දුයි?
ඔව්. උනන්දුයි. ඒත් ජන්මයෙන් ලැබූ කිසියම් වාසනා ගුණයකුත් මෙයට ඈඳිලයි තියෙන්නේ. ඒ දේ සමහරුන් තුළ නැති වෙන්න පුළුවන්. ඒකට මම මොකද කරන්නේ?

වර්තමානයේ ප්‍රචලිත දෙයක් තමයි පෙරදිග සංගීත භාණ්ඩත් එක්ක පවත්වන පැදුරු සාද. පැදුරු සාජ්ජ ගැන ඔබ දරන මතය මොකක්ද?
සංගීතයේ පරිහානිය නිසා ඇති වූ ප්‍රතිඵලයක් හැටියටයි පැදුරු සාද මම දකින්නේ. මොකද අද ප්‍රසංග වේදිකාවක් ගත්තොත් ඉලෙක්ට්‍රොනික් වාද්‍ය භාණ්ඩත් එක්ක කරන කාටෝර සංගීතයක්නෙ තියෙන්නේ. සංගීතයේ නියම ආශ්වාදය එහි නැහැ. විඳින්න පුළුවන් සංගීතයක් තියෙද්දී මිනිසුන් විඳවන්න පුරුදු කරල තියෙන්නේ. ඉතින් සැබෑ වින්දනයක් ඇති ඉහළ රසඥතාවක් ඇති උදවිය පැදුරු සාද පවත්වනවා. එයටත් අද ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ එකතු කරල සැබෑ මිහිර වනසලයි තියෙන්නෙ.

ඔබ එවැනි සාදවලට සහභාගි වෙන්නේ නැහැ ?
පණ්ඩිත් අමරදේවයන් හිතවතුන් එක්ක පවත්වන පැදුරු සාද තියෙනවා. මාසයකට එකක් දෙකක් වගේ. ඒවට සහභාගි වෙනවා. එහි නියම වින්දනය තියෙනවා. නමුත් බොහෝ අවස්ථාවල පැදුරු සාද නම් මම ප්‍රතික්ෂේප කරනවා.

විශිෂ්ඨ ශ්‍රේණියේ ශිල්පියෙක් හැටියට ඔබ රාජ්‍ය අනුග්‍රහයන් එහෙම ලබනවාද?
කොහෙත්ම නැහැ. ලංකාවේ සංස්කෘතික අමාත්‍යාංශයක් තියෙනවා. අපේ සංස්කෘතිය, විශිෂ්ඨ ශිල්පීන්ගේ හැකියාවන්, ජාත්‍යන්තර තලයට ඔසවා තබන්න කිසිම වැඩපිළිවෙළක් එයට නැහැ. අපි මේ තරමින්වත් මිනිසුන් අතර පිළිගැනීමට ලක්වෙලා තියෙන්නෙ අපේම උත්සාහයෙන් උනන්දුවෙන්. දක්ෂතා මත පදනම් වුණු සංස්කෘතියක් ද දැන් තියෙන්නේ. එහෙම දෙයක් නැහැ. පිටරටවල සිංහල සංවිධාන වලින් ආරාධනා කළ උත්සවවලට තමයි මම මෙතෙක් කලක් සහභාගි වුණේ.
ඩ ඔබ වගකිව යුත්තන් මේ ගැන දැනුවත් කරල තියෙනවාද?
දැනුමක් තියෙන අයටනෙ මේවයේ වගකීම් පවරන්නේ. ඉතින් මම මොකටද දැනුවත් කරන්නේ. ඔය එක එක දේශපාලකයා පස්සේ ගිහින් අරක දෙන්න මේක දෙන්න කියල ඉල්ලන පුරුද්දක් සැබෑ කලාකරුවා තුළ නැහැ. ඔවුන් ඒ දේ සොයා බලා කළ යුතුයි.

නිර්මාණ හැකියාවට මාධ්‍යයන් තුළින් ලැබෙන ප්‍රචාරය ගැන සෑහීමකට පත් වෙනවද?
දක්ෂතා අගයකරන මාධ්‍යන් තියෙනවා ඔබ වැනි. ඒ එක්කම විද්‍යුත් මාධ්‍යයනුත් තියෙනවා. හැබැයි කවදාවත් ශාස්ත්‍රීය සංගීතයට නිසි අගැයුමක් මේ රටේ කිසිම මාධ්‍යයකින් රජයකින් ලැබුණෙ නැහැ. එහෙම ලැබුණා නම් ජාත්‍යන්තර වේදිකාවේ ඉහළින් වැජඹෙන ශිල්පීන් අපේ රටේ බිහි වෙනවා. ඉස්සර නම් ගුවන් විදුලිය, රූපවාහිනීය හොඳ වින්දනයක් ඇති ශාස්ත්‍රීය වැඩසටහන් ඉදිරිපත් කළා. නව රජය යටතේ වත් එවැනි වැඩසටහන් තැනෙයි කියල විශ්වාසයක් තියෙනවා. මා කළ නිර්මාණයත් රූපවාහිනියේ තියෙනවා. නමුත් ඒවා විකාශනය කරන්න තරම් වේලාවක් ඒ අයට නැතිව ඇති.

සාකච්ඡා කළේ :
**පණ්ඩුක සමරසේකර**



තිළිණ 6 පිටෙන්

### දඹල අච්චාරු

අවශ්‍ය ද්‍රව්‍ය
ඉතාම ළපටි පුංචිම දමළ කරල්වලින් ග්‍රෑම් 300
විනාකිරි අඩු කොප්ප බාගයයි
සීනි මේස හැඳි 1
ගම්මිරිස් කුඩු තේ හැඳි 1/2
සෝදා වේලාගත් කොත්තමල්ලි ඇට තේ හැඳි 1
ගම්මිරිස් ඇට 10
කරාබු නැටි 3
කරඳමුංගු 3
ලුණු තේ හැඳි 1 1/2

සාදා ගන්නා ක්‍රමය:
ගම්මිරිස් කුඩු හැර අනෙකුත් සියල්ල එකට දමා ලිප තබා උතුරන්නට හැර සෝදා දෙකොන් කපා ගත් දඹල උතුරණ මිශ්‍රණයට දමා වරක් උතුරණ විට ලිපෙන් ඉවතට ගෙන ගම්මිරිස් කුඩු දමා හොඳින් වියළුණ බෝතලයකට දමා මූඩිය තදින් වසා දවස් දෙකකට පසු ආහාරයට ගන්න.

අධ්‍යක්ෂ විධායක සුපවේදී
**පබිලිස් සිල්වා**
ගල්කිස්ස මහ හෝටලය.